මගේ අංකය / எனது இல. : RG/NB/01/චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. : 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. : 2889491

ඊමේල් / மின்னஞ்சல் / E-mail : rgd@sltnet.lk, rg@rgd.gov.lk

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

பதிவாளர் நாயகம் திணைக்களம்

REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය

தலைமை அலுவலகம்

HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. : 565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site : www.rgd.gov.lk


(120)

දිනය / திகதி / Date: 2019.07.25

චක්‍රලේඛ අංක : 11/2019

සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

<u>ඔප්පු දෙවන පිටපත් සඳහා හිඟ මුද්දර ගාස්තු සහ දඩ මුදල් අය කර ගැනීම</u>

නොතාරිස්වරුන් ලියා සහතික කරනු ලබන ඔප්පුවල දෙවන පිටපත් සඳහා නියමිත මුද්දර ගාස්තු ගෙවා නොමැති විට හිඟ මුද්දර ගාස්තු සහ ඒ සඳහා දඩ මුදල් අය කර ගැනීමේදී, සියලුම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල ඒ සඳහා එක් ක්‍රමවේදයක් අනුව කටයුතු නොකරන බව නිරීක්ෂණය වේ. මේ සම්බන්ධව විගණන විමසුම්වලට නිතර නිතර පිළිතුරු සැපයීමටද සිදු වී තිබේ. මෙම ගාස්තු දෙපාර්තමේන්තුව සතුවන ආදායමක් නොවන බැවින් මේ සම්බන්ධව කටයුතු කිරීමට යාමේදී ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්ට ද ප්‍රායෝගික ගැටළුවලට මුහුණ දීමට සිදු වී ඇති බව මා වෙත වාර්තා වේ. එබැවින් උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් මෙයට පෙර නිකුත් කරනු ලැබ ඇති සියලුම චක්‍රලේඛ අවලංගු කරන අතර, මින් ඉදිරියට මේ සම්බන්ධයෙන් පහත විධිවිධාන අනුගමනය කරන ලෙස දන්වමි.

02. ඔප්පු දෙවන පිටපත් සඳහා මුද්දර ගාස්තු අඩුවෙන් ගෙවා ඇති බව අනාවරණය වූ සෑම ඔප්පුවක්ම, එක් එක් මාසය සඳහා වෙන වෙනම ලැයිස්තු ගතකොට, අදාළ ඔප්පුවේ සහතික පිටපතක් ද සමඟ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්/අදාළ පළාත් ආදායම් කොමසාරිස් වෙත හිඟ මුද්දර ගාස්තු සහ හිඟ දඩ මුදල් අය කර ගැනීම සඳහා යොමු කළ යුතු බව දන්වමි.

03. ඔප්පු දෙවන පිටපත් සම්බන්ධයෙන් අයවිය යුතු හිඟ මුද්දර ගාස්තු පිළිබඳව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්/අදාළ පළාත් ආදායම් කොමසාරිස් වෙත යවනු ලබන වාර්තා යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු බව අවධාරණය කරමි.

04. අයවිය යුතු හිඟ මුද්දර ගාස්තු පහත ආකෘතියට අනුව සකස් කළ ලේඛනයක ඇතුළත් කර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්/අදාළ පළාත් ආදායම් කොමසාරිස් වෙත යොමු කරන්න.

| දිනය | නොතාරිස්ගේ නම | ඔප්පුවේ අංකය හා දිනය | ඔප්පුවේ ස්වභාවය | වටිනාකම | නියමිත මුද්දර ගාස්තුව | ගෙවා තිබූ මුද්දර ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

05. ඉහත උපදෙස් අනුව කටයුතු කළ බවට තහවුරුවක් ඔබ විසින් තබා ගත යුතු අතර, විගණනයේදී ඉදිරිපත් කිරීම සඳහා එයට අදාළ ලිපිගොනු හා ලේඛන නිසි පරිදි පවත්වාගෙන යා යුතු බව ද දන්වා සිටිමි.

06. මෙම චක්‍රලේඛයේ දින සිට සෑම මසකම දෙවන පිටපත් පරීක්ෂා කිරීමේදී අනාවරණය වන හිඟ මුද්දර ගාස්තු පිළිබඳ තොරතුරු ඊළඟ මාසයේ 10 වන දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්/අදාළ පළාත් ආදායම් කොමසාරිස් වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

07. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්/ අදාළ පළාත් ආදායම් කොමසාරිස් විසින් නියමිත හිඟ මුද්දර ගාස්තු අයකළ බවට ඔබ වෙත වාර්තා කළ පසු, ඔබ විසින් පවත්වා ගෙන යනු ලබන හිඟ මුද්දර ගාස්තු ලේඛනයේ සහ අදාළ ඔප්පු දෙවන පිටපතේ ඒ බව සටහන් කිරීමට කටයුතු කළ යුතුය. හිඟ මුද්දර ගාස්තු ලේඛනය පහත ආකෘතියට අනුව සකස් කරන්න.

| දිනය | නොතාරිස්ගේ නම | ඔප්පුවේ අංකය හා දිනය | ඔප්පුවේ ස්වභාවය | වටිනාකම | නියමිත මුද්දර ගාස්තුව | ගෙවා තිබූ මුද්දර ගාස්තුව | දේශීය ආදායම් කොමසාරිස් /පළාත් ආදායම් කොමසාරිස් විසින් අයකළ මුදල හා දිනය | දෙවන පිටපත අදාළ සටහන යෙදූ දිනය | විෂයය ලිපිකරුගේ අත්සන | ඉඩම් රෙජිස්ට්‍රාර්ගේ අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

08. මෙතෙක් හිඟ සහ දඩ පනවා ගෙවා නොමැති සියලුම ඔප්පුවල දෙවන පිටපත්, අදාළ මුද්දර ගාස්තු අය කර ගැනීම සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්/අදාළ පළාත් ආදායම් කොමසාරිස්වරුන් වෙත යවා, එම හිඟ දඩ ලේඛන 2019/08/31 දිනට වසා දැමීමට කටයුතු කර ඒ බව මා වෙත වාර්තා කරන ලෙස ද දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් :01. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය -
02. විගණකාධිපති -
03. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව -
04. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් -
05. සියලුම පළාත් ආදායම් කොමසාරිස්වරු -
06. කලාප භාර සියලුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් -
(01–06: කාරුණික දැන ගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා)
07. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් -

එන්. සී. විතානගේ
රෙජිස්ට්‍රාර් ජනරාල්
...ජනරාල් දෙපාර්තමේන්තුව
...සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.